**දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමණාකරණ ව්‍යාපෘතිය - 2020**

---

දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමණාකරණ ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, හරිත දේශගුණික අරමුදල (GCF) සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) අතර 2016 අගෝස්තු 05 දින එළඹි ප්‍රදාන ගිවිසුමේ 17.01(ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

---

ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුම අනුව, වාරිමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. දේශගුණික විපර්යාසවල අවදානම් සහ බලපෑම් වලට එරෙහිව ආහාර සුරක්ෂිතතාව, සෞඛ්‍යය සහ යහපැවැත්ම ආරක්ෂා කිරීම සඳහා ජල කළමනාකරණය සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් හරහා වියළි කලාපයේ කුඩා වතු හිමියන්ගේ, විශේෂයෙන්ම කාන්තාවන්ගේ ජීවන සහ ජීවනෝපාය ඉහළ නැංවීමට ශ්‍රී ලංකා රජයේ දැක්මට සහාය වීම ව්‍යාපෘතියේ අරමුණු වේ. වියළි කලාපයේ ගංගා ද්‍රෝණි තුනක ග්‍රාමීය වාරිමාර්ග පද්ධතිවල ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සහ දේශගුණික බලපෑම් අවම වන පරිදි ගොවිතැන් ක්‍රම පුළුල් කිරීම, අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ට ආරක්ෂිත පානීය ජලය සඳහා වසර පුරා ප්‍රවේශය ලබාදීම සඳහා දේශගුණික බලපෑම් අවම වන පරිදි විමධ්‍යගත ජල සැපයුම සහ කළමනාකරණ විසඳුම් වැඩිදියුණු කිරීම, කුඩා වතු හිමියන්ගේ ජල කළමනාකරණය සහ නියඟයට අනුවර්තනය වීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා දේශගුණය සහ ජල විද්‍යාත්මක නිරීක්ෂණ සහ පුරෝකථන පද්ධතිය ශක්තිමත් කිරීම සහ ගංවතුර සහ ව්‍යාපෘති කළමනාකරණය යන සංරචක හතරක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 7,521.45 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 52.084 ක් වන අතර ඉන් රු. මිලියන 5,499.71 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 38.084 ක් සැපයීම සඳහා හරිත දේශගුණික අරමුදල (GCF) සමඟ එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2017 ජූලි මස ආරම්භ කරන ලද අතර, 2024 ජූනි වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය වියාචනය

---

ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් මතයක් ප්‍රකාශ නොකරමි. මාගේ වාර්තාවේ 2 වගුවේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන්, මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතයක් සඳහා පදනමක් සැපයීම සඳහා ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

## 1.4 මතය වියාචනය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

පහත නිරීක්ෂණ සිදුකරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2017 ජූලි සිට 2024 ජූනි දක්වා කාලය සඳහා ශ්‍රී ලංකා රජයට (GOSL) රු.මිලියන 5,499.71 කට සමාන එ.ජ.ඩො. මිලියන 38.084 ක් ලබාදීම සඳහා 2017 ජූනි 07 දින එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ හරිත දේශගුණික අරමුදල (Green Climate Fund) (GCF) අතර අරමුදල් සහිත ක්‍රියාකාරකම් ගිවිසුමක් (ප්‍රදාන) අත්සන් කර තිබුණි. ගිවිසුමට අනුව, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය (MMDE) ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කරවීමේ ආයතනය වන අතර එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) ප්‍රතීතනය ලත් ආයතනය වේ. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දේශගුණික විපර්යාස හේතුවෙන් කුඩා වතු හිමියන් මුහුණ දෙන ගැටළු අවම කිරීම ව්‍යාපෘතියේ අරමුණ වන අතර 2016 ඔක්තෝබර් 04 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව 2017 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයක් ස්ථාපිත කර තිබුණි. අරමුදල් සහිත ක්‍රියාකාරකම් ගිවිසුමේ (FAA) 3 වන වගන්තියට අනුව, එ.ජ.ඩො.මිලියන 38.084 කට සමාන මුදලක්, අරමුදල් ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය | එකඟ වේ | අරමුදල් සපයන නියෝජිතායතනය විසින් සපයනු ලබන අරමුදල් මහ බැංකුව හරහා යොමුකර ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සම්පාදනය කිරීමේ අරමුණ ඇතිව සහ සහාය වීමට ප්‍රතීතනය ලත් ආයතනය (UNDP) විසින් ක්‍රියාත්මක කරවීමේ ආයතනය (MMDE) වෙත ප්‍රදානයක් ආකාරයෙන් ලබාදෙනු ලැබේ. හරිත දේශගුණික අරමුදල පසුගිය වසර 03 තුළ රු.මිලියන 3,774 කට සමාන එ.ජ.ඩො. මිලියන 20.4 ක් UNDP වෙත ලබා දී තිබුණද, 2020 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 1,020 කට සමාන එ.ජ.ඩො. මිලියන 5.7 ක් පමණක් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය (MMDE) වෙත ලබා දී තිබුණු අතර ඉතිරි එ.ජ.ඩො. මිලියන 14.7 ක මුදල ව්‍යාපෘතියේ කටයුතු කිහිපයක් සිදු කිරීම සඳහා UNDP විසින් වැය කර තිබුණි.<br><br>මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණේ සම්පූර්ණ වියදම්වලින් සියයට 28 ක් නියෝජනය කරන ක්‍රියාත්මක කරවීමේ ආයතනයට (MMDE) ලබා දී තිබුණු මුදල සඳහා පමණක් වන බැවින්, සමස්ත ව්‍යාපෘතියේ මූල්‍ය කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය එයින් පිළිබිඹු නොවන අතර මාගේ විගණන කටයුතු MMDE විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් වෙත පමණක් සීමා විය. | | |
| (ආ) | මහවලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙන් (UNDP) එ.ජ.ඩො. මිලියන 5.7 ට සමාන රු.මිලියන 1,020 ක් සහ ශ්‍රී ලංකා රජයෙන් (GOSL) රු.මිලියන 290 කට සමාන එ.ජ.ඩො. මිලියන 02 ක් 2020 වර්ෂය අවසන් වන විට ලැබී තිබුණි. UNDP සහ GOSL වෙතින් ලැබුණු දායකත්වය මූල්‍ය ප්‍රකාශනයේ වෙන වෙනම දක්වා නොතිබුණු අතර මුළු ශුද්ධ වත්කම් / හිමිකම් වශයෙන් රු.මිලියන 446.6 ක මුදලක් පමණක් ඇතුලත්ව මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණි. | එකඟ වේ | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මගින් දෙපාර්ශවයම දරන වියදම් හඳුනාගත යුතුය. |

## 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති ලේඛනයේ 7 කොටසේ 69 සහ 70 වගන්ති | වාර්ෂික වැඩ සැලැස්ම විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | බලපෑම් අවම කිරීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශය සුදුසු පියවර ගනිමින් සිටියි. | වාර්ෂික වැඩ සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘති ලේඛනයේ 7 වන කොටසෙහි 69 වැනි වගන්තිය | 2020 ඒකාබද්ධ බෙදාහැරීමේ වාර්තාව අනුමත කිරීමේදී, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට අදාළ වියදම් පමණක් වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සහතික කර තිබුණි. | විගණන නිරීක්ෂණ අපට පිළිගත හැකි අතර ඒ අනුව වාරිමාර්ග අමාත්‍යාංශය බලපෑම් අවම කිරීම සඳහා සුදුසු පියවර ගනිමින් සිටියි. | කිසිදු කොන්දේසියකින් තොරව වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඒකාබද්ධ බෙදාහැරීමේ වාර්තාව අනුමත කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘති ලේඛනයේ IX(111) සහ X වගන්ති | 2020 දෙසැම්බර් 31 දක්වා ශ්‍රී ලංකා රජය කොටසේ අපේක්ෂිත දායකත්වය එ.ජ.ඩො. 8,499,000 ක් වේ. කෙසේ වෙතත්, විගණනයට ලැබුණු තොරතුරු අනුව, 2020 දෙසැම්බර් 31 අවසානය වන විට ශ්‍රී ලංකා රජය විසින් ලබා දී ඇත්තේ එ.ජ.ඩො. 2,133,123 ක් හෙවත් සියයට 25.10 ක දායකත්වයක් පමණක් බව නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණ අපට පිළිගත හැකි අතර ඒ අනුව වාරිමාර්ග අමාත්‍යාංශය බලපෑම් අවම කිරීම සඳහා සුදුසු පියවර ගනිමින් සිටියි. | ගිවිසුම ප්‍රකාරව අරමුදල් දායක කලයුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

---------------------------

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ----- | ---------------- | -------------------- | ----------------------- |
| (අ) | අරමුදල් ක්‍රියාකාරකම් පනතේ 1 වැනි වගන්තිය සහ අරමුදල් යෝජනාව B.1 (8) ප්‍රකාරව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ව්‍යාපෘතියේ සම-මූල්‍යකරණ කටයුතු සඳහා වගකීම දරයි. කෙසේ වෙතත්, ඉහත ආයතන විසින් සම-මූල්‍යකරණ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ අපට පිළිගත හැකි අතර ඒ අනුව වාරිමාර්ග අමාත්‍යාංශය බලපෑම් අවම කිරීම සඳහා සුදුසු පියවර ගනිමින් සිටියි. | ගිවිසුමට අනුව අදාළ පාර්ශ්වයන්ගෙන් සම-මූල්‍යකරණය ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | FAA හි උපලේඛන 3 ට අනුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක | විගණන නිරීක්ෂණ අපට පිළිගත හැකි අතර ඒ අනුව වාරිමාර්ග අමාත්‍යාංශය බලපෑම් | ගිවිසුමට අනුව අදාළ පාර්ශ්වයන්ගෙන් සම-මූල්‍යකරණය ලබා ගැනීමට අවශ්‍ය |

| | | | |
|---|---|---|---|
| | කළ යුතුය. කෙසේ වෙතත්, FAA හි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සිදු කර නොතිබුණි. එසේම, වාරිමාර්ග අමාත්‍යාංශය සහ ප්‍රතීතනය ලත් ආයතනය (UNDP) විසින් සම්පූර්ණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සිදු කර තිබුණි. | මෙම අවම කිරීම සඳහා සුදුසු පියවර ගනිමින් සිටියි. | ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.2 වාරක පරීක්ෂණ නිරීක්ෂණ

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | අරමුදල් සහිත ක්‍රියාකාරකම් ගිවිසුමට (FAA) අනුව කඳුරැලි (cascades) 50 ක වැව් සහ ජලාශ 325ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා එ.ජ.ඩො. මිලියන 15.6ක මුදලක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, 2021 වසර අවසන් වන විට කඳුරැලි 17 ක වැව් 225 ක් පමණක් ප්‍රතිසංස්කරණය කර තිබුණි. ඒ අනුව ඉතිරි වැව්වල ප්‍රතිසංස්කරණ කටයුතු ඉතිරි ව්‍යාපෘති කාලසීමාව තුළ අවසන් කළ හැකිද යන්න ගැටළු සහගත වේ. | විගණන නිරීක්ෂණ අපට පිළිගත හැකි අතර ඒ අනුව වාරිමාර්ග අමාත්‍යාංශය බලපෑම් අවම කිරීම සඳහා සුදුසු පියවර ගනිමින් සිටියි. | ව්‍යාපෘති කාල සීමාව තුළ ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ලබා දී ඇති තොරතුරු අනුව, ව්‍යාපෘතිය සඳහා එක් වැවකට රු.මිලියන 8.26 ක් වෙන් කර ඇත. කෙසේ වෙතත්, වැව් ප්‍රතිසංස්කරණය කිරීම කෙරෙහි මෙම ව්‍යාපෘතිය මගින් අවධානය යොමු කර තිබුණු අතර කඳුරැල්ල තුළ වැවට සම්බන්ධ වන ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ අපට පිළිගත හැකි අතර ඒ අනුව වාරිමාර්ග අමාත්‍යාංශය බලපෑම් අවම කිරීම සඳහා සුදුසු පියවර ගනිමින් සිටියි. | සමස්ත ව්‍යාපෘති අරමුණ ඉටු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතිය ආරම්භ කර වසර 03කට ආසන්න කාලයක් ගතවී ඇතත්, වැව් 22ක් සඳහා වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් අදාළ නිෂ්කාශන ලබාගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමහර කඳුරැලි නිමකර නොතිබුණි. | විගණන නිරීක්ෂණ අපට පිළිගත හැකි අතර ඒ අනුව වාරිමාර්ග අමාත්‍යාංශය බලපෑම් අවම කිරීම සඳහා සුදුසු පියවර ගනිමින් සිටියි. | කාල සීමාව තුළ රේඛීය දෙපාර්තමේන්තු වලින් අදාළ නිෂ්කාශන ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 පද්ධති හා පාලනයන්

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘතියේ මුළු අයවැයගත ප්‍රතිපාදනය රු. මිලියන 1,807.4 ක් වූ අතර මුළු වියදම රු. මිලියන 2,181.3 කි. ඒ අනුව, ව්‍යාපෘතිය සඳහා වන ප්‍රතිපාදනය ඉක්මවා රු. මිලියන 373.9ක් නිසි අනුමැතියකින් තොරව වැය කර තිබුණි. | විගණන නිරීක්ෂණ අපට පිළිගත හැකි අතර ඒ අනුව වාරිමාර්ග අමාත්‍යාංශය බලපෑම් අවම කිරීම සඳහා සුදුසු පියවර ගනිමින් සිටියි. | අරමුදල් වියදම් කිරීමට පෙර නිසි අනුමැතිය ලබා ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය මගින් ව්‍යාපෘතිය සඳහා විශේෂ (ඩොලර්) ගිණුමක් ශ්‍රී ලංකා මහ බැංකුවේ විවෘත කර නොතිබුණු අතර අරමුදල, හරිත දේශගුණික අරමුදලෙන් UNDP ගිණුමට ලැබී තිබුණි. | විගණන නිරීක්ෂණ අපට පිළිගත හැකි අතර ඒ අනුව වාරිමාර්ග අමාත්‍යාංශය බලපෑම් අවම කිරීම සඳහා සුදුසු පියවර ගනිමින් සිටියි. | මහ බැංකුවේ නිසි පරිදි ගිණුමක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දින දක්වා ශ්‍රී ලංකා රජය විසින් රු.මිලියන 289.9 ක් සහ හරිත දේශගුණික අරමුදල මගින් රු.මිලියන 2,181.3 ක් ව්‍යාපෘතිය සඳහා වැයකර තිබුණි. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතියේ සියලු වියදම් රජයේ අයවැයට වාර්තා කර නොතිබුණු බව හා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට අදාළ වියදම් පමණක් වාර්තා කර තිබුණු බව නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණ අපට පිළිගත හැකි අතර ඒ අනුව වාරිමාර්ග අමාත්‍යාංශය බලපෑම් අවම කිරීම සඳහා සුදුසු පියවර ගනිමින් සිටියි. | සියලුම ව්‍යාපෘති වියදම් රජයේ අයවැයට වාර්තා කිරීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | FAA හි 7 වන වගන්තිය ප්‍රකාරව, වාර්තා කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම උපලේඛන 04 අනුව සිදු කළ යුතුය. ව්‍යාපෘති ක්‍රියාකාරකම් වාර්තා කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා, ව්‍යාපෘතිය විසින් නිසි පරිදි ප්‍රගතිය වාර්තා කිරීමේ යාන්ත්‍රණයක් සකස් කළ යුතුය. මෙම කාර්යය සඳහා, ව්‍යාපෘති බෙදාහැරීම්, බෙදාහැරීමේ ප්‍රමාණයන් සහ එක් එක් සහ සියළු ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ කාල සැලැස්මක්මක් ව්‍යාපෘතිය මඟින් හඳුනාගත යුතුය. මෙම ව්‍යාපෘති බෙදාහැරීම්, ප්‍රතිලාභ සහ අයවැයගත ඉලක්ක මත පදනම්ව වාර්ෂික වැඩ සැලැස්ම සකස් කළ යුතුය. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සහ UNDP යන පාර්ශ්ව දෙකෙන්ම විමසන ලද නමුත් නිසි ප්‍රගති වාර්තාව විගණනයට ඉදිරිපත් නොකරන ලද බැවින් ව්‍යාපෘතියේ ප්‍රගතිය සමාලෝචනය කිරීමට නොහැකි විය. | විගණන නිරීක්ෂණ අපට පිළිගත හැකි අතර ඒ අනුව වාරිමාර්ග අමාත්‍යාංශය බලපෑම් අවම කිරීම සඳහා සුදුසු පියවර ගනිමින් සිටියි. | ගිවිසුමට අනුව ප්‍රගති වාර්තාව සකස් කළ යුතුය. |